---

නුවරඑළිය ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජූලි 11දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත්කර ඇති නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට අදාළව ලැබී තිබූ රු.3,327,048ක උසාවි දඩ සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.1,500,000ක ස්ථාවර තැන්පතු එදිනට පැවති අත්තිකාරම් ශේෂයටද හර කර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල මුදල් ගිණුම්වල ශේෂය වෙනුවට බැංකු ප්‍රකාශ අනුව ශේෂ දැක්වීම හේතුවෙන් මුදල් ශේෂය රු.43,737ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ලෙජර් ගිණුම් 08ක ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.3,006,574ක වෙනස්කම් නිරීක්ෂණය විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ). පිළිතුරු නොළත් විගණන විමසුම්.

2013 මාර්තු 31 දින වන විට විගණන විමසුම් 15කට පිළිතුරු සපයා නොතිබුණි.

(ආ). තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

i. අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.160,991,109ක් වූ වත්කම් විෂයයන් 08ක් සහ වටිනාකම රු.51,072,269ක්වූ බැරකම් විෂයයන් 02ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

ii. රු.290,000ක වියදමින් සභාව සඳහා ට්‍රැක්ටර් ට්‍රේලරයක් මිලදීගැනීම පිණිස සීමිත මිලගණන් කැඳවා තිබුණද, අදාළ සැපයුම්කරු තෝරාගත් ආකාරය පිළිබඳ සෑහීමකට පත්වීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.3. නිරවුල් නොකළ ගිණුම් ශේෂ

2007 වර්ෂයට පෙර සිට පැවත එන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.83,273,860ක්වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,072,463ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,857,273ක් විය.

2.2 මූල්‍ය පාලනය.

උපකාර්යාලවල නිලධාරීන් විසින් පාවිච්චි කළ ලදුපත් පොත් 34ක් ක්ෂේත්‍ර ආදායම් එකතු කිරීමේ පොත් 19ක් හා ක්ෂේත්‍ර ආදායම් තැන්පත් කිරීමේ පොත් 08ක් ආපසු ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය වෙත භාරදී නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| I. | වරිපනම් හා බදු. | 8,920 | 4,679 | 4,241 |
| II. | බදු කුලී. | 4,220 | 2,998 | 1,222 |
| III. | බලපත්‍ර ගාස්තු. | 2,873 | 2,873 | - |
| IV. | වෙනත් ආදායම්. | 3,296 | 1,861 | 1,435 |

### 2.3.2 බදු කුලී

(අ). සභාවට අයත් ඉඩම් 27ක් කිසිදු තක්සේරු කිරීමකින් තොරවද, කඩකාමර 31ක් 2000 වර්ෂයේදී ලබාගන්නා ලද තක්සේරුවක් පදනම් කරගෙන බදුදී තිබුණි.

(ආ). නානුඔය උපකාර්යාල බලප්‍රදේශය තුල ස්ථාන 03ක ඇති කඩකාමර 16ක් කඩකුලී තක්සේරු කිරීමකින් තොරව මාසික බදුකුලී වශයෙන් රු.75 බැගින් අයකරමින් පැවතුණි.

(ඇ). නානුඔය උපකාර්යාල බලප්‍රදේශය තුල පිහිටි සභාව සතු ඉඩම් කොටස් 12කින් 2013 මාර්තු 31 දින වන විට රු.118,026ක ඉඩම් බදු මුදල් හිඟව පැවතුණි. මෙම ඉඩම් වලට අදාළ බදු බිල්කිරීම් 2009 වර්ෂයෙන් පසු සිදුකර නොතිබූ අතර, ඉහත සඳහන් හිඟය 2009 වර්ෂය දක්වා කර තිබූ බිල්කිරීම් වලින් අයවීමට ඇති හිඟයන් විය.

(ඈ). නානුඔය බලප්‍රදේශය තුල පිහිටි සභාව සතු නිවාස 05කින් 2013 මාර්තු 31 දින වනවිට රු.99,546ක බදු මුදලක් හිඟව පැවති අතර, මෙම නිවාස පිහිටි ස්ථාන පිළිබඳ විස්තර හෝ බදු ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3.3 ප්‍රචාරක දැන්වීම් පුවරු ආදායම්

(අ). සභාවට අයත් කඳපොල සහ නානුඔය උපකාර්යාල බලප්‍රදේශය තුල ස්ථාපිත කර ඇති දැන්වීම් පුවරු 06කින් අයවිය යුතු රු.916,200ක බදු මුදලක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/07 දරන ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ 39වන උපවගන්තිය හා 2012 දෙසැම්බර් 21 දිනැති අංක 1790 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ). කඳපොල නගරයේ පිහිටි පෞද්ගලික මූල්‍ය සමාගමක් විසින් 2012/2013 වර්ෂවල ප්‍රචාරක දැන්වීම් පුවරු වෙනුවෙන් ගෙවා තිබුණු රු.25,000ක මුදලකින් කුවිතාන්සි අක්‍රමික ලෙස වෙනස් කරමින් රු.22,500ක මුදලක් නිලධාරීන් විසින් වංචා කර ඇති බවද විගණනයේදී අනාවරණය විය.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 5,360,923 |
| (ii) | මුද්දර ගාස්තු | 7,327,304 |

2.4 වත්කම් කළමනාකරණය.

නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්.

කුබොටා වර්ගයට අයත් ට්‍රැක්ටරයක් හා යතුරු පැදියක් දීර්ඝ කාලයක සිට ධාවනයෙන් ඉවත්කර තිබූ අතර, අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.5 අවිධිමත් ගනුදෙනු.

සමාලෝචිත වර්ෂයේ ජූලි සහ අගෝස්තු මාසවලදී දින 20ක් තුල පවත්වන ලද ඩෙංගු මර්ධන වැඩසටහන් වෙනුවෙන් ගමන් වියදම් සහ සංයුක්ත දීමනා වලට අතිරේක වශයෙන් රු.70,875ක සංග්‍රහ වියදම් වැයකර තිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පෙගටන්වත්ත ජල ටැංකිය ඉදිකිරීම සඳහා ලබාදී තිබූ තාක්ෂණික උපදෙස් හා සැලැස්මට පරිබාහිරව පෙරෝසිමෙන්ට් තාක්ෂණය යොදා ගනිමින් අදාළ ජල ටැංකිය ඉදිකර තිබූ අතර, පෙරෝසිමෙන්ට් තාක්ෂණයේදී භාවිතා නොකරන ලද ෂටරින් අයිතමය සඳහා රු.39,886ක් වැයකර තිබූ බව2012 නොවැම්බර් 15 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ). දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී අනුමත ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සලසන ලද ජල ව්‍යාපෘති 03ක් සඳහා ඇස්තමේන්තුගත හා ගිවිසුමගත Type 1000 ජලනල වෙනුවට Type 600 ජලනල භාවිතා කර තිබුණි.

(ඇ). ගම නැගුම ව්‍යාපෘතිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කර තිබූ ප්‍රස්ටන්වත්ත අඩිපාර ඉදිකිරීම් ව්‍යාපෘතිය පිළිබඳව 2013 පෙබරවාරි 15 දින පරීක්ෂාවේදී භෞතිකව කියුබ් 32.37ක් යොදා තිබුණද,කියුබ් 37.44ක් සඳහා ගෙවීම් කිරීම නිසා කොන්ක්‍රීට් යොදා තිබූ ප්‍රමාණයට වඩා කියුබ් 5.13ක ප්‍රමාණයක් වෙනුවෙන් රු.51,890ක අධි ගෙවීමක් සිදුකර තිබූ බව අනාවරණය විය.

(ඈ). 2011 වර්ෂයට අදාළව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති 14ක් වෙනුවෙන් සභාව වෙත ලබාදී තිබූ රු.1,800,000ක ප්‍රදාන 2012 වර්ෂය අවසාන වන විටදී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති 04ක් වෙනුවෙන් රු.50,000 බැගින් රු.200,000ක අත්තිකාරම් මුදල්ද ගෙවා තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 ප්‍රකාරව ඇහිලි සලකුණු යන්ත්‍රයක් සඳහා මිලගණන් කැඳවීමේදී කිසිදු පිරිවිතරයක් සඳහන් නොකර මිලගණන් කැඳවා තිබුණි.

(ආ). මාස 08ත් අවුරුදු 04ත් අතර කාල පරාසායකට අයත් රු.160,000ක අත්තිකාරම් විගණන දිනයවූ 2013 මැයි 09 දින වන විටද පියවා නොතිබුණි.

(ඇ). 2011 ජනවාරි සිට 2012 දක්වා කාලයට අදාළව සභා ආදායම් ලෙස ලැබී තිබූ රු.92,920ක් වටිනා චෙක්පත් 09ක් අගරු වී තිබුණු අතර, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 188 (ඇ) (ඈ) හා (උ) වගන්ති අනුවද, 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති 31 ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

(ඈ). සභාව සතු වත්කම්වල අයිතිය තහවුරු කරගැනීමට අවශ්‍ය නෛතික සාක්ෂිවල ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් නොතිබීම හේතුවෙන් සභාව සතු නානුඔය ට්‍රාන්ස්පෙෂන් ඉඩමේ හිඟ ඉඩම් බදු අයකර ගැනීම සහ ඉඩම නැවත ලබාගැනීම සඳහා පැවරූ නඩුව සභාවට අවාසි වන පරිදි තීන්දු කරන ලදි. රු.63,480ක නඩු ගාස්තුවක් ගෙවීමට සිදුවී තිබූ අතර, සභාව සතුව තිබූ ඉඩමේ අයිතියද සභාවට අහිමිවී තිබුණි.

3. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.
(ආ). අභ්‍යන්තර පාලනය.
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). ණයගැති ණයහිමි පාලනය